# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 43 — 1973 ජනවාරි 19 වැනි සිකුරාද — 1973.01.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 49 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය — — — | 60 |

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් කොයාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් කෙසේවුවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමත් රාජ්‍ය සේවයෙහි සිටින්නන් හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**ආදර්ශ ආකෘති පත්‍රය**

**නීතිඥ ලිපිකරු තනතුර**

(1) සම්පූර්ණ නම :—

(අ) පෙළපත් නාමය :————.

(ආ) වෙනත් නම් :————.

(2) ලිපිනය :————.

(3) වයස සහ උපන් දිනය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය)

(4) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙකුද යන්න :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් :————.

(6) පළපුරුදුකම් :————.

(7) දැනට නිරත රක්ෂාව (ඇත්නම්) :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරණ ලද සියළු විස්තර සත්‍ය බවටත් නිවැරදි බවටත් මම සහතික කරමි. මෙහි සඳහන් යම් විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරට තෝරා ගැනීමට ප්‍රථම සොයාගතහොත්, එයින් මා තනතුරට නුසුදුස්සකු වනු ලබන බවත්, පත්කිරීමෙන් පසු සොයාගතහොත් වන්දි නොගෙවා පහ කරනු ලබන බවත් මම දනිමි.

————————

අයදුම්කරුගේ අත්සන

දිනය :————.

1–666—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ ගැමුණුපුර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ එරාවූර් සහ කෝරළ පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය රෙජිස්ට්‍රාර් ධුරය**

ගැමුණුපුර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැළකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973.02.19 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1972 දෙසැම්බර් මස 27 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

2–566—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ මහිලවට්ටවාන් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනෙයිපත්තු උතුර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

මහිලවට්ටවාන් උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියා පදිංචි තැපෑලෙන් 1973. 02. 19 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1972 දෙසැම්බර් මස 27 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දිය.

1–565—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ උන්නිච්චයි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනෙයිපත්තු උතුර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

උන්නිච්චයි උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සෑහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අතිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා ඒවා ලියා පදිංචි තැපෑලෙන් 1973. 02. 19 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1972 දෙසැම්බර් මස 27 දින,
මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දිය.

1–564—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කටුගම්පොල උතුරු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කටුගම්පොල උතුරු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආන්දමට සකස් කරනා ලද අයදුම් පත් 1973. 02. 24 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

“ දිසාපති, කච්චේරිය, කුරුණෑගල.”

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය:—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන්ද, පළාත් පාලන ආයතන වල නියෝජිතයින්ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973 ජනවාරි මස 02 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කටුගම්පොල උතුරු කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපත් නාමය සමග පැහැදිලි අකුරින්) :———.

(2) ලිපිනය :———.

(3) ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.

(4) (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :———.

(ආ) උපන් දිනය හා ස්ථානය :———

(5) විවාහක අවිවාහක බව :———.

(6) අධ්‍යාපන සුදුසුකම් :———.

(7) දැනට කරන රක්ෂාව :———.

(8) මීට පෙර රැකියාවක් කළේද ? එසේනම් එය පිළිබඳ විස්තර :———.

(9) තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :———.

(10) ඉල්ලුම්කරු ණයගැතිව සිටීද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

(11) ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? :———.

(12) මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :———.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———

1–563—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඊඑස්. 1/46/73

**ඉංජිනේරු සේවා මණ්ඩලය**

**ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ විදුලි ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු**

ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ විදුලි ඉංජිනේරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති මගින් ඉදිරිපත් කළ යුතු අයදුම්පත් 1973 පෙබරවාරි මස 24 වැනි දින හෝ ඊට පෙර කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ, ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන :** (1) මුද්‍රිත අයදුම්පත් ආකෘති තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 8" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූ ද, මුද්දර නොගැසුවා වූ ද, ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම්පතක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙණ පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

2. *සේවයෙහි යෙදවීමේ නියමයන් හා සේවා කොන්දේසි*

(i) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවෝ ඔවුන්ට නියම කරන ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුත්තාහ.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් අංක 15,001/8 හා 1972.3.14 දින දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ උප ලේඛනයෙහි දක්වෙන විදුලි ඉංජිනේරු කණ්ඩායම් දෙකෙන් එකකට පත්කරනු ලැබේ. කෙසේ වෙතත් පළමු අට අවුරුදු සේවා කාලය තුළදී නිලධාරීන් එක් කණ්ඩායමක සිට තවත් කණ්ඩායමකට තාවකාලිකව මාරු කළ හැක.

(iv) සෙසු බඳවාගැනීමේ නියමයන් හා සේවා කොන්දේසි අංක 15,001/8 හා 1972.3.14 දින දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති පරිදි වේ.

3. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය :—

රු. 9,960 ට හා රු. 13,920 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රු. 8,160—3×360—රු. 9,240/9,960—3 360—රු. 11,040—13×480—රු. 17,280.

**සටහන.**—(i) පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවෝ ඉහත සඳහන් වැටුප් පරිමාණයේ වර්ෂයකට රු. 10,320 ආරම්භක වැටුපක් මත පැමිණීමට සුදුසු වන්නාහ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවෝ, වර්ෂයකට රු. 9,960 ට පෙර ඇති 1 වන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණයකින් සමත් විය යුත්තාහ. මෙම පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය හා පරිපාටිය ඉංජිනේරු සේවා මණ්ඩලය මගින් නියම කරනු ලබන පරිදි වේ.

පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව පත්කරනු ලබන අයදුම්කරුවකු ඔහුගේ පත්වීමේ දින සිට දෙවර්ෂයක කාලයක් තුළදී මෙම පරීක්ෂණයෙන් සමත් විය යුතු වන්නේය.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවෝ, වර්ෂයකට රු. 13,920 ට පෙර ඇති දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා ඉංජිනේරු සේවා මණ්ඩලය මගින් නියම කරනු ලබන පරිදි පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගත යුතු වන්නාහ.

(iv) දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ නියෝගවලට අනුකූලව ඔහුගේ වැටුප තීරණය කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය :—

(i) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ii) 1973 පෙබරවාරි මස 24 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි උපරිම වයස් සීමාව අදාල නොවේ.)

(iii) (අ) ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයෙහි හෝ ලන්ඩන්හි ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයෙහි අධි සාමාජිකත්වය හෝ සාමාජිකත්ව දරන බව,

හෝ

(ආ) ලංකා විශ්ව විද්‍යාලයෙන් හෝ වෙනත් කිසියම් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ප්‍රදානය කෙරෙන විදුලි ඉංජිනේරු උපාධියක් ලබා ඇති බව,

හෝ

(ඇ) විදුලි ඉංජිනේරු ආයතනය (ලන්ඩන්) මගින් පවත්වන පරීක්ෂණයේ I වන, II වන සහ III වන කොටස්වලින් සාමාර්ථ්‍යය ලබා ඇති බව හෝ ලංකා ඉංජිනේරු ආයතනය මගින් විදුලි ඉංජිනේරුවන් සඳහා පවත්වෙන පරීක්ෂණයේ I වන, II වන සහ III වන කොටස්වලින් සාමාර්ථ්‍යය ලබා ඇති බව හෝ සමාන පරීක්ෂණයකින් සාමාර්ථ්‍යය ලබා ඇති බව,

හෝ

(ඈ) ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයෙහි හෝ ලන්ඩන්හි ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් විදුලි ඉංජිනේරු ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වය දරන බව,

හෝ

(ඉ) කටුබැද්ද උසස් කාර්මික විද්‍යායතනයේ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පස් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවකින් සාමාර්ථ්‍යය ලබා ඇති බව, හෝ වෙනත් පිළිගත් ඩිප්ලෝමා පාඨමාලාවකින් ලබා ඇති බව,

හෝ

(ඊ) ලංකා ඉංජිනේරු ආයතනයේ විදුලි ඉංජිනේරු කාණ්ඩයේ අධිසාමාජිකත්වයක් (එෆ්. අයි. ඊ. ලංකා) හෝ සාමාජිකත්වයක් (එම්. අයි. ඊ. ලංකා) ලබා ඇති බව.

5. පහත සඳහන් ලේඛන සියල්ලම හෝ ඉන් එකක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට නියම කරනු ලැබූ විට ඔවුහු එසේ ඉදිරිපත් කළ යුත්තාහ.

(අ) උප්පැන්න සහතිකය.

(ඈ. යු. බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතික පිළිගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මෙයින් එකක් අධ්‍යයනය පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පිළිබඳව සමත්ව ඇති උසස්ම විභාග පිළිබඳ සහතික.

**සටහන :**

(i) කිසියම් ලේඛන හෝ ලේඛනවල පිටපත් කිසිවක් අයදුම් පතට ඈමිණිය යුතු නොවේ.

(ii) ලේඛන ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්තව සිටින නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් ඔවුන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද දිනය, අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ කෙළින්ම ඔහු වෙත දැන්විය යුතුය. මෙම කාර්යය සඳහා අයදුම්පත් සමග ඔවුන් වෙත නිකුත් කරනු ලබන තැපැල් පත ('ආ' සලකුණ දරන) ප්‍රයෝජනයට ගත හැකිය.

7. අයදුම්පත් සහ ඒ පිළිබඳ සෙසු සියලු ම ලියවිලි ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. එසේම මණ්ඩලයේ කිසියම් නිලධාරියකුට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ II අ වන ඡේදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ආකෘති සමග අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන මුද්‍රිත තැපැල් පත ('අ' සලකුණ දරන) එහි සඳහන් උපදෙස් පරිදි සම්පූර්ණ කර ආපසු එවිය යුතුය. එවිට ඔවුන්ගේ අයදුම්පත් ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලයට ලැබුණ බව දන්වනු ලැබේ මෙම අවශ්‍යතාවට අනුකූලව කටයුතු නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

මෙම අවශ්‍යතාව සපුරාලන ලද එහෙත් අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත අයදුම්පත ලැබුණ බව දන්වා තැපැල් පතක් නොලැබෙන අයදුම්කරුවන් ඒ බව වහාම ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂකට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඕ. මහාදේව්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය,
මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 ජනවාරි මස 08 වැනි දින,

1-675—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඊඑස්. 1/16/73.

**ඉංජිනේරු සේවා මණ්ඩලය**

**ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ යාන්ත්‍රික ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු**

ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති මඟින් ඉදිරිපත් කළ යුතු අයදුම්පත් 1973 පෙබරවාරි මස 24 වැනි දින හෝ ඊට පෙර කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ, ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සටහන :**

(i) මුද්‍රිත අයදුම්පත් ආකෘති තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 8"×4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දා වූද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුවේ.

**2. සේවයෙහි යෙදවීමේ නියමයන් හා සේවා කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ ඔවුන්ට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුත්තාහ.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, අංක 15,001/8 හා 1972.3.14 දින දරන, ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ උපලේඛනයෙහි දැක්වෙන යාන්ත්‍රික ඉංජිනේරු කාණ්ඩයම් තුනෙන් කවරකට හෝ පත් කරනු ලැබේ. කෙසේ වෙතත් පළමු අට අවුරුදු සේවා කාලය තුළදී නිලධාරීන් එක් කාණ්ඩයමක සිට තවත් කාණ්ඩයමකට තාවකාලිකව මාරු කළ හැක.

(iv) සෙසු බඳවා ගැනීමේ නියමයන් හා සේවා කොන්දේසි අංක 15,001/8 හා 1972.3.14 දින දරන, ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති පරිදි වේ.

3. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේ ය : රු. 9,960 ට හා රු. 13,920 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව වර්ෂයකට රු. 8,160—3×360—9,240/9,960—3×360—11,040—13×480—රු. 17,280.

**සටහන :**

(i) පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවෝ ඉහත සඳහන් වැටුප් පරිමාණයේ, වර්ෂයකට රු. 10,320 ආරම්භක වැටුපක් මත තැබීමට සුදුසු වන්නාහ.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ, වර්ෂයකට රු. 9,960 ට පෙර ඇති 1 වන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණයකින් සමත් විය යුත්තාහ. මෙම පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය හා පරිපාටිය ඉංජිනේරු සේවා මණ්ඩලය මඟින් නියම කරනු ලබන පරිදි වේ.

පූර්ණ වෘත්තීය සුදුසුකම් සහිතව පත් කරනු ලබන අයදුම්කරුවකු ඔහුගේ පත්වීමේ දින සිට දෙවර්ෂයක කාලයක් තුළදී මෙම පරීක්ෂණයෙන් සමත් විය යුතු වන්නේ ය.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ, වර්ෂයකට රු. 13,920 ට පෙර ඇති දෙවන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා ඉංජිනේරු සේවා මණ්ඩලය මඟින් නියම කරනු ලබන පරිදි පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගත යුතු වන්නාහ.

(iv) දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවකු තෝරා ගනු ලැබුවහොත් ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ 7 වන පරිච්ඡේදයේ නියෝගවලට අනුකූලව ඔහුගේ වැටුප තීරණය කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

(i) විශිෂ්ට චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ii) 1973 පෙබරවාරි මස 24 වන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් කෙරෙහි උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(iii) (අ) ලන්ඩන්හි යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයෙහි අධිසාමාජිකත්වය හෝ සාමාජිකත්වය දරන බව,

හෝ

(ආ) ලංකා විශ්ව විද්‍යාලයෙන් හෝ වෙනත් කිසියම් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ප්‍රදානය කෙරෙන යාන්ත්‍රික ඉංජිනේරු උපාධියක් ලබා ඇති බව.

හෝ

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ආයතනය (ලන්ඩන්) මගින් පවත්වන පරීක්ෂණයේ 1 වන හා 2 වන කොටස්වලින් සාමාර්ථය ලබා ඇති බව, හෝ ලංකා ඉංජිනේරු ආයතනය මගින් යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා පැවැත්වෙන පරීක්ෂණයේ 1 වන හා 2 වන කොටස් වලින් සාමාර්ථය ලබා ඇති බව හෝ සමාන පරීක්ෂණයකින් සාමාර්ථය ලබා ඇති බව, හෝ

(ඈ) කටුබැද්ද උසස් කාර්මික විද්‍යායතනයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පස් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවෙන් සාමාර්ථය ලබා ඇති බව වෙනත් පිළිගත් ඩිප්ලෝමා පාඨමාලාවකින් සාමාර්ථය ලබා ඇති බව, හෝ

(ඉ) ලංකා ඉංජිනේරු ආයතනයේ, යාන්ත්‍රික ඉංජිනේරු කාණ්ඩයේ අධි සාමාජිකත්වය (එෆ්. අයි. ඊ. ලංකා) හෝ සාමාජිකත්වය (එම්.අයි.ඊ. ලංකා) ලබා ඇති බව.

5. පහත සඳහන් ලේඛන සියල්ලම හෝ ඉන් එකක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට නියම කරනු ලැබූ විට ඔවුහු එසේ ඉදිරිපත් කළ යුත්තාහ.

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු. බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන රෙගුලාසි පරිදි උපන්දින පාසැලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතික පිළිගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්, මෙයින් එකක් අධ්‍යයනය පිළිබඳ අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල. දෙමළ හා ඉංග්‍රීසි පිළිබඳව සමත්ව ඇති උසස්ම විභාග පිළිබඳ සහතික.

සටහන :

(i) කිසියම් ලේඛන හෝ ලේඛනවල පිටපත් කිසිවක් අයදුම් පතට ඇමිණිය යුතු නොවේ.

(ii) ලේඛන ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්තව සිටින නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩලවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් ඔවුන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද දිනය, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හෝ ඊට පෙර ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ කෙළින්ම ඔහු වෙත දැන්විය යුතුය. මෙම කාර්යය සඳහා අයදුම්පත් සමග ඔවුන් වෙත නිකුත් කරනු ලබන තැපැල් පත ('ආ' සලකුණ දරන) ප්‍රයෝජනයට ගත හැකිය.

7. අයදුම්පත් සහ ඒ පිළිබඳ සෙසු සියලුම ලියවිලි ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. එසේම මණ්ඩලයේ කිසියම් නිලධාරියකුට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ II අ වන ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් බලපාන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ආකෘති සමග අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ලබන මුද්‍රිත තැපැල් පත ('අ' සලකුණ දරන) එහි සඳහන් උපදෙස් පරිදි සම්පූර්ණ කර ආපසු එවිය යුතුය. එවිට ඔවුන්ගේ අයදුම්පත් ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලයට ලැබුන බව දන්වනු ලැබේ. මෙම අවශ්‍යතාවට අනුකූලව කටයුතු නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

මෙම අවශ්‍යතාව සපුරාලන ලද එහෙත් අයදුම්පත් භාරගන්නා අවසාන දින සිට සති තුනක් ඇතුළත අයදුම්පත ලැබුණ බව දන්වා තැපැල් පතක් නොලැබෙන අයදුම්කරුවන් ඒ බව වහාම ඉංජිනේරු සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවෙකු ගැන සලකා බැලීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

බී. මහාදේව,
ලේකම්,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය,
මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 ජනවාරි මස 08 වැනි දින.

1–676—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලක්සල ගෘහ කර්මාන්ත වෙළඳ හලෙහි සාමාන්‍යාධිකාරි තනතුරු

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලක්සල ගෘහ කර්මාන්ත වෙළඳ හලෙහි සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973.02.05 වැනි දින හෝ ඊට පෙර හෝ කොළඹ 2, තැ. පෙ. 570, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. කවරයෙහි වම් කෙළවර, "ලක්සල සාමාන්‍යාධිකාරී තනතුරු" යන්න සඳහන් කළ යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි.**—මෙම තනතුරු තාවකාලිකය. රජයේ අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්කිරීම සඳහා තෝරාගත් අපේක්ෂකයා පත්වීම ලැබ තුන් අවුරුද්දකදී පහත සඳහන් විෂයයන්ගෙන් යුත් විභාගයකින් සමත් විය යුතුය. නියමිත කාල සීමාව තුළදී මෙම විභාගයෙන් සමත්වීමට අපොහොසත් වීම වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවනු ඇත.

(i) මුදල් රෙගුලාසි,

(ii) ආයතන සංග්‍රහයේ රෙගුලාසි,

මෙම විභාගයේ තත්ත්වය ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරීන් විසින් සමත්විය යුතු පළමුවැනි කාර්යක්ෂමතා විභාග තත්ත්වයට සමානය.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය පහත දක්වෙන පරිදි වේ.

වාර්ෂික වැටුප රු. 6,720 කින් පටන්ගෙන රු. 360 බැගින් වාර්ෂික වේතනාධික 12 කින් රු. 14,400 දක්වා වැඩි වේ. (රු. 11,520 ට පෙර කාර්යක්ෂමතා කඩඉම).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

2

(ආ) 1973.02.05 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව අදාල නොවේ).

(ඇ) **කෙළින්ම බඳවාගන්නවුන් සඳහා :** පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගෞරව උපාධියක් හෝ ඊට උසස් විභාගයකින් සමත් විය යුතුය.

සටහන : විධායක තනතුරක පරිපාලනය පිළිබඳ පළපුරුද්දක් ඇති අය සහ වාණිජ හෝ අර්ථ ශාස්ත්‍ර හෝ සංඛ්‍යා ලේඛන පිළිබඳ ගෞරව උපාධිධාරීන් විශේෂයෙන් සලකා බලනු ලබේ.

(ඈ) විධායක තනතුරක වාණිජ කටයුතු පරිපාලනය පිළිබඳ තුන් අවුරුද්දක පළපුරුද්දක්.

**දෙපාර්තමේන්තු සේවකයන් සඳහා.**—

(ඉ) (i) අවුරුදු 3 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කර්මාන්ත සහකාර වරුන්, හෝ

(ii) අවුරුදු 12 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වෙළඳ කළමනාකාරවරුන්, හෝ

(iii) සාමාන්‍ය ලිපිකාර සේවයේ II වැනි පන්තියේ "අ" ඛණ්ඩයේ අවුරුදු 12 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ලිපිකරු නිලධාරීන්, හෝ

(iv) සාමාන්‍ය ලිපිකාර සේවයේ අවුරුදු 3 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජ හෝ අර්ථ ශාස්ත්‍රය හෝ සංඛ්‍යා ලේඛන පිළිබඳ උපාධියක් හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති නිලධාරීන්ට මේ සඳහා ඉදිරිපත් විය හැකිය.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් යම් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. උපන්දින පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ඇති බෞතීස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඈ) චරිත සහතික දෙකක්,

(ඇ) වෘත්තීය හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂය :**

(i) ඉල්ලුම් පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිනිය යුතුය.

(ii) ලියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් වන්නාවූ ද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූ ද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

එම්. සිවනාදන්,
ලේකම්,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය.

1973. 1. 2,
කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය,
18, ශ්‍රී ජිනරතන පාර,
තැ. පෙ. 570, කොළඹ 2.

**ලක්සල සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "ලක්සල සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් ලේකම්, කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර අමාත්‍යාංශය වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. විවාහකද අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදිංචි නාම :————.

————,
අත්සන.

දිනය :————.

1–572—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

තනතුරු ඇබෑර්තු—නීති නිලධාරී

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

**සුදුසුකම්.**—අවුරුදු 7ක වෘත්තීය පළපුරුද්ද සහිත පෙරකදෝරුවකු වීම.

**වැටුප් ක්‍රමය.**—රු. 1,175—5×45—රු. 1,400—(මසකට සියල්ල අඩංගු).

අයදුම් පත් නියමිත ආකෘති පත්‍රයන්හි විය යුතු අතර, ඒවා මෙම කාර්යාලයට පැමිණ හෝ ලිපිනය ලියූ මුද්දර අලවන ලද කවරයක් එවීමෙන් හෝ ලබාගත හැකිය. අයදුම්පත් කළමනාකාර (පිරිස් හා පාලන), ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, තැ. පෙ. 194, 120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 2 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන්, 73.01.31 වැනි දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථාවල නියුක්ත වූවන්ගේ අයදුම් පත් එකී දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

කළමනාකාර (පිරිස් හා පාලන),
ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

තැ. පෙ. 194,
අංක 120, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 2.

1–657—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව**

**ප්‍රකාශන නිලධාරී හා පුස්තකාලයාධිපති තනතුර—පරිපාලන**

**අභ්‍යාස ආයතනය**

රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ, පරිපාලන අභ්‍යාස ආයතනයේ ප්‍රකාශන නිලධාරී හා පුස්තකාලයාධිපති තනතුර සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීමේ කෙළවර ඇති ආකෘති පත්‍රයේ ආකාරයට සැපයිය යුතු අයදුම්පත් කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රය රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් යන ලිපිනයට ලිවිය යුතු අතර, එවා 1973.2.20 වැනි දිනට මත්තෙන් ඔහු වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "ප්‍රකාශන නිලධාරී හා පුස්තකාලයාධිපති තනතුර" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතුය.

2. **වැටුප් පරිමාණය.**—තනතුරට අනුයුක්ත ඒකාබද්ධ වැටුප් පරිමාණය වර්ෂයකට රු. 6,720—360×12—480—7×14,400ක් වේ. 1969.10.1 වැනි දිනට පෙරාතුව තිබුණු අනුරූප වැටුප් පරිමාණය රු. 4,080—360—480—11,280ක් විය යුතුය. රු. 7,800 සහ රු. 11,520 වැටුප් වලට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. රු. 11,520 ක (ඒකාබද්ධ) වැටුපට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම් පසුකර යාමට සුදුසුවීම සඳහා නිලධාරියා ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණයෙන් සාමාර්ථයක් ලබාගත යුතුයි.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිර ය. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නො දරයි නම්, හෙතෙම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයෙක් වනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා පත්වීම ලබන දින රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි නම් ඔහු/ඇය කවදුරටත් එම විශ්‍රාම වැටුප් අයිතිය භුක්ති විඳිනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයා දැනටමත් රජයේ සේවයේ නියුක්ත නැතිනම්, මුල්වතාවේ තුන් අවුරුදු පරිවාස කාලයක් මත පත් කෙරෙනු ඇත. රාජ්‍ය සේවයෙහි නියැලී ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම එක් අවුරුදු කාල පරිච්ඡේදයක වැඩ බැලීමේ පදනමක් මත වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම විසින්ම තමන්ට පහත සඳහන් සුදුසුකම් තිබෙන බව ඔප්පු කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව හෝ රාජ්‍ය පරිපාලන විද්‍යාව විෂයයන් වශයෙන් ගෙන සමාජ විද්‍යා පිළිබඳ උපාධිධාරියකු වීම;

(ආ) ලංකා පුස්තකාල සංගමයේ මධ්‍ය විභාගයෙන් හෝ කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා ඩිප්ලෝමා විභාගයෙන් හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ලබා තිබීම;

(ඇ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා නිපුණත්වයක් ලබා තිබෙන බව;

(ඈ) 1973.2.1 වැනි දිනට වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව (දැනටමත් රජයේ සේවයෙහි යෙදී සිටින්නන්ට මෙම වයස් සීමාව අදාළ නොවේ.)

5. අයදුම්කරුවන් විසින් පහතින් සඳහන් ලියකියවිලි වල පිටපත් ස්වකීය ඉල්ලුම් පත්‍ර වලට අමුණා එවිය යුතු ය.—

(අ) පූර්වෝක්ත 4(අ) ඡේදයෙහි සඳහන් උපාධි සහතිකය;

(ආ) පූර්වෝක්ත 4(ආ) ඡේදයෙහි සඳහන් වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය;

(ඇ) උප්පැන්න සහතිකය (සැ.යු.— බෞතීස්ම සහතිකය හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහා නිකුත් කැරෙන උප්පැන්න සහතික හෝ භාර ගනු නො ලැබේ.)

(ඇ) ප්‍රකාශන වැඩ සහ පුස්තකාල වැඩ පිළිබඳව ඔහු/ඇය ලබා ඇති පළපුරුද්ද පිළිබඳව ඕනෑම සහතිකයක්;

(ඉ) ඔහුගේ/ඇයගේ චරිතය ගැන සඳහන් මෑත දී ලබාගත් සහතික දෙකක්.

සටහන.—මෙම ලියකියවිලි වල පිටපත් අයදුම්කරුවන් වෙත පෙරළා එවනු නො ලැබේ. මෙම සහතික වල මුල් පිටපත් නො එවිය යුතු ය.

6. නියමිත අයදුම්කරුවන් විසින් මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවන ''රාජ්‍ය සේවා පත්කිරීම් වලට අදාළ පොදු කොන්දේසි'' කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කළ යුතු ය.

බී. මහාදේව,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත්පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

ටොරිංටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1973.1.2 වැනිදා.

## ආදර්ශ අයදුම් පත්‍රය

### ප්‍රකාශන නිළධාරි හා පුස්තකාලයාධිපති තනතුර – පරිපාලන අභ්‍යාස ආයතනය

1. සම්පූර්ණ නම :————.

(පැහැදිලි අකුරින්—වාසගම හෙවත් අගට යෙදෙන නමට යටින් ඉරක් අඳින්න)

2. ස්ථිර ලිපිනය :————.

3. කාර්යාධීලය ලිපිනය :————.

4. (අ) උපන් දිනය :————.

(ආ) 1973.2.1 වැනි දිනට නියම වයස : අවුරුදු :————.මාස :———— දින :————.

5. ජාතිය :

(1) ලාංකිකත්වය ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද යන වග : ————.

(2) ලාංකිකත්වය පරම්පරාවෙන් නම්, පහතින් සඳහන් අය උපන් ස්ථානය සඳහන් කරන්න :

(i) අයදුම්කරු :————.

(ii) අයදුම්කරුගේ පියා :————.

(iii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(iv) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

(සහතිකවල පිටපත් අමුණන්න).

| විශ්ව විද්‍යාලයේ නම | ලබා ඇති උපාධිය | වර්ෂය | විෂයයන් | සාමාන්‍ය /විශේෂ |
|---|---|---|---|---|
| | | | | |

7. වෘත්තීය සුදුසුකම් :————.

(සහතිකවල පිටපත් අමුණන්න)

| ආයතනයේ නම | ලබා ඇති සහතික | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

8. පළපුරුද්ද :————

(සහතිකවල පිටපත් අමුණන්න).

| පුස්තකාලයේ නම | උසුලනු ලැබූ තත්ත්වය | සේවා කාලය | පූර්ණකාලීනද / අර්ධ කාලීනද යන්න |
|---|---|---|---|
| | | | |

9. චරිතය පිළිබඳ සහතික ලබාගෙන ඇති අයගේ නම් සහ ලිපිනයන් :——
(පිටපත් අමුණන්න)

10. වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :————.

(දැන්වීමේ 4 වැනි ඡේදයේ යටතේ ඇති සටහන බලන්න.)

මේ අයදුම්පතෙහි දැක්වෙන සියළු විස්තර සත්‍ය බව ද, නිවැරදි බවද මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි බව හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු වීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළි වුවහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා සේවයෙන් පහ කරනු ලැබීමටද, යටත් වන බව මම දැන සිටිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1-662—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### සැපයුම් හා අලෙවි නිලධාරී තනතුර

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සැපයුම් හා අලෙවි නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කොට 1973. 02. 05 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

2. වැටුප් පරිමාණය.—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් පරිමාණය : රු. 5,304 න් පටන් ගෙන රු. 144 වාර්ෂික වේතනාධික 9 කින් ද, රු. 180 වාර්ෂික වේතනාධික 8 කින් ද, රු. 240 වාර්ෂික වේතනාධික 2 කින් ද, රුපියල් 8,520 දක්වා වැඩි වන වාර්ෂික වැටුප් ක්‍රමයකි. රු. 6,708 ට සහ රු. 7,500 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයන්ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත්තේ ය.

3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුප් අහිමි ය.

සංලක්ෂ්‍යය : ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරී යකු තෝරා ගනු ලැබුවහොත් මුලින්ම ඔහු මේ තනතුරෙහි නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත් කරනු ලැබේ.

රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු වන්නේ නම් :—

(i) මෙම තනතුරට පත් කරනු ලබන්නේ අවුරුදු තුනක පරීක්ෂණ කාලයක් සිට ය.

(ii) ඔහු රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානයන් ක්‍රියාවට නැඟීම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථා වන් අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(iii) පරීක්ෂණ කාල සීමාව ඇතුළත ඔහු විසින් සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවයක් ලබා ගත යුතු ය.

(iv) පරීක්ෂණ කාලසීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම වෙනත් කරුණු අතර, නියමිත කාලසීමාවන් ඇතුළත දී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමද මත රඳා පවතිනු ඇත. නියමිත කාල සීමා තුළදී මෙම ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම් අත්හිටවනු ලැබීමට හේතු වනු ඇති අතර, නියමිත කාල සීමාව ඉක්මවා තවත් මසක් ඇතුළතදී පරීක්ෂණය කින් සමත් නොවුවහොත්, එම "අත්හිටුවීම" නතර කිරීම කට පරිවර්තනය කර, පරීක්ෂණය සමත් වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) **කාර්යක්ෂමතා කඩඉම් :** තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුළතදී ඔහු සිංහල භාෂා විෂයයෙන්, නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය. එනම් අංක 640 හා 1964. 3. 25 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි සඳහන් iv වැනි ශ්‍රේණියේ ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම් විලම්බනය කරනු ලැබීමට හේතු වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම් :** සෑම ඉල්ලුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ට චරිතයෙන් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973. 02. 05 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි බව. (දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

(i) (අ) ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයන් 3 කින් හෝ ඊට සමාන හෝ උසස් හෝ විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැපයුම් සහ අලෙවි පරිපාලන, ගබඩා හෝ වෙළඳ වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතු ය.

හෝ

(ii) (අ) දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් හයකින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඒ හා සමාන හෝ උසස් විභාගයකින් හෝ සාමාර්ථය ලබා සිටිය යුතු ය.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැපයීම් සහ අලෙවි පරිපාලනය ගබඩා හෝ වෙළඳ වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් ස්වකීය ඉල්ලුම්පත්වලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය සහ,

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූ, රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරීත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 1,
1972. 12. 15 දින දීය.

**සැපයුම් හා අලෙවි නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය**

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙලවරේ "සැපයුම් හා අලෙවි නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ත්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. විවාහකද අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම් කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදි කරු වී ඇත් නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම් සහ පදිංචි නාම :————.

————,
අත්සන.

දිනය :————.

1–682—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුර**

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර තනතුරු සඳහා මෙයින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත දක්වා ඇති ආකෘතියට අනුව පිළියෙල කොට 1973. 02. 14 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් පරිමාණය.**—මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 2,910—90×17—4,440 කි. රු. 3,810 වාර්ෂික වැටුප් ලක්ෂ්‍යයට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත්තේ ය.

3. **සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :**

1. තනතුරු තාවකාලිකය.

2. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **අධ්‍යාපන සුදුසුකම්.**—හැම ඉල්ලුම්කරුවෙකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම්වලින් යුක්ත බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත බව.

(ආ) 1973. 02. 14 වැනි දිනට අවුරුදු 25 ට නො අඩු හා අවුරුදු 45 ට නො වැඩි බව. (දැනටමත් රජයේ නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවරකට නො වැඩි වාර ගණනක දී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය, ගණිතය ඇතුළු ව විෂයන් හයකින් (මෙයින් එකක් ගණන් තැබීම විය යුතු ය.) අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් නැතහොත් ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම.

(ඈ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක ගබඩා භාරකරුවකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 3 ක සේවයක් තිබිය යුතු ය.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ.) ස්වකීය ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතු ය.

(i) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකය.

(ii) උසස්ම අධ්‍යාපන සහතිකය සහ,

(iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ.)

6. දැනට රජය යටතේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩල යටතේ හෝ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

7. අයදුම්කරුවන් ස්වකීය වියදමින් ම කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පැමිණිය යුතු ය.

8. අයදුම්පතේ දී ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බැව් තෝරා ගනු ලැබීමට ප්‍රථම සොයා ගතහොත් අයදුම්කරු නුසුදුස්සකු කිරීමට ද තෝරාගනු ලැබීමෙන් පසු සොයා ගතහොත් සේවයෙන් පහ කිරීමට ද සිදුවනු ඇත.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ II ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නා වූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාල වන්නා වූද කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

ජී. පී. හත්තොටුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකාරීත්ව),
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙනුවට.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973. 01. 08.

තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘතිය

(සැ. යු.—ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස මුදුන් කෙළවරේ "තාවකාලික III ශ්‍රේණියේ ගබඩා භාරකාර නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.)

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා උපන් ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)

4. ජාතිය :————.

5. විවාහකද, අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ/හෝ ශිල්පීය සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න :————.

9. යම්කිසි සාපරාධී වරදකට නඩුවක හෝ උසාවියකදී වැරදි කරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන් තිදෙනාගේ නම සහ පදිංචි තැන :————.

————,
අත්සන.

දිනය :————.

1–708—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුරප්පාඩු—ගුවන් භටයෝ

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්ති ගණවල ඇති පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

(අ) ගුවන් යානා වෘත්ති.—ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකින් අ. පො. ස. (සා. පෙ.) පරීක්ෂණයෙන් සමත් වී සිටිය යුතුය. ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් ගෙන සමත් වී ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) සාමාන්‍ය ඉංජිනේරු වෘත්ති.—ගණිතය සහ භෞතික විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකින් අ. පො. ස. (සා. පෙ.) පරීක්ෂණයෙන් සමත් වී සිටිය යුතුය.

(ඇ) මෙහෙයවීම් ගුවන් සහ ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරු වෘත්ති.—ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හතරකින් අ. පො. ස. (සා. පෙ.) පරීක්ෂණයෙන් සමත් වී සිටිය යුතුය.

(ඈ) වෛද්‍ය සහ දන්ත වෛද්‍ය වෘත්ති.—ස්වස්ථතාව/කායික විද්‍යාව හෝ ජෛව විද්‍යාව සහ ගණිතය/අංක ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් අ. පො. ස. (සා. පෙ.) පරීක්ෂණයෙන් සමත් වී සිටිය යුතුය.

(ඉ) පරිපාලන සහ උපකරණ වෘත්ති.—ගණිතයෙන් සාමාර්ථයක් හෝ අංක ගණිතයෙන් සම්මාන සාමාර්ථයක් ඇතිව අ. පො. ස. සා. පෙ. පරීක්ෂණයෙන් විෂයයන් හතරකින් සමත් වී සිටිය යුතුය.

(ඊ) සෙසු වෘත්ති.—(නි. වැඩ සේවා, මෙහෙයවීම් භූමි, ලෝහ තහඩු කාර්මිකයෝ, ටෙලිපෝන් සේවකයෝ, මැහුම්කරුවෝ, රියැදුරෝ සහ අරක්කැමියෝ) ;

8 වන ශ්‍රේණියෙන් (කනිෂ්ඨයෙන්) හෝ ඊට සමාන පන්තියකින් සමත් වී තිබිය යුතුය. මේ බවට පාසැලේ ප්‍රධානාචාර්යවරයාගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

2. අවශ්‍ය සුදුසුකම් :

(අ) අධ්‍යාපනය.—අවශ්‍ය අධ්‍යාපන මට්ටම පුරප්පාඩු ලැයිස්තුවෙහි දැක්වේ.

(ආ) වරණීය සුදුසුකම් :

(i) යම් අයදුම්කරුවකුට අධ්‍යාපනය, වයස, උස, බර නැතහොත් පපුව පිළිබඳ නියමිත සුදුසුකම් නොමැති වුව ද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන යම් ශිල්පීය දැනුමක් හෝ වෙනයම් නිපුණතාවක් හෝ ඇත්නම්, ගුවන් හමුදාපතිගේ මනාපය පරිදි, ඔහු ගැන සලකා බැලීමටත්, සුදුසු බව පෙනී ගියහොත් හමුදාවට බඳවාගෙන උචිත තරාතිරමකට ඇතුලත් කිරීමටත් අවකාශ තිබේ.

(ii) ක්‍රීඩා අතින් විශිෂ්ටතාවක් ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(iii) ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ සේවය සඳහා දැනටමත් බඳවාගෙන ඇති ගුවන් භටයන්ට අයදුම් කරන වෘත්ති ගණය සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් තිබේ නම්, ඔවුන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) ශාරීරික තත්ත්වය :

(i) උස අඩි 5 අඟල් 5
(ii) බර රාත්තල් 105 යි
(iii) පපුව අඟල් 32 (හුස්ම පහළට හෙළා සිටින විට)

(ඈ) සාමාන්‍ය :

සෑම අයදුම්කරුවෙකු ම—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ii) 1973 ජනවාරි මස 1 වන දිනට වයස අවුරුදු 18 ට නො අඩු වූ ද අවුරුදු 24 ට නොවැඩි වූ ද අයකු විය යුතුය.

(iii) අවිවාහකයකු විය යුතුය. (හමුදා සේවයට බැඳුණු දින සිට අවුරුදු දෙකක් ඇතුලත විවාහ වීමට ගුවන් භටයන්ට අවසර දෙනු නොලැබේ.)

3. සේවා කොන්දේසි.—සියලුම ගුවන් භටයන් හැඩි දැඩි පුද්ගලයන් විය යුතුය. නියම කරනු ලැබුවහොත් තම වෘත්තියට පරිබාහිර වූ ඕනෑම රාජකාරියක් දිවා රෑ දෙකෙහි අතිශය දුෂ්කර තත්ත්වයන් යටතේ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක දී ඉටු කිරීමට සූදානමින් සිටිය යුතුය.

(අ) බඳවා ගැනීමේ කොන්දේසි.—තෝරා ගනු ලබන අපේක්ෂකයන් නිත්‍ය ගුවන් හමුදාවේ (දෙවන පංතියේ) ගුවන් භට ශ්‍රේණියට ඇතුලත් කර ගනු ලබන අතර, ඔවුන් අවුරුදු 12 ක් ගුවන් භට හමුදාවේ සේවය කළයුතු වේ. මින් මුල් අවුරුදු පහ නිත්‍ය ගුවන් හමුදාවේ සේවය කළ යුතු අතර ඉතිරි අවුරුදු හත නිත්‍ය උපසේවයේ සේවය කළ යුතුය. තවදුරටත්, සේවය කිරීම සඳහා නැවත බැඳීමට, සුදුසු ගුවන් භටයන්ට අවස්ථාව ඇත.

(ආ) ගුවන් භටයෝ ගුවන් හමුදා පනතට ද, ගුවන් හමුදාවේ රෙගුලාසිවලට සහ නියෝගවලට ද යටත් වන්නාහ.

(ඇ) රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයෝ.—තෝරා ගනු ලබන අපේක්ෂකයන් ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ඈ) වැටුප් ප්‍රමාණ සහ දීමනා.—රජය විසින් අනුමත කොට ඇති ගුවන් හමුදා නව වැටුප් සංග්‍රහය (ගැසට් නිවේදනය මතු පළවනු ඇත.) අනුව වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

(ඉ) ගුවන් භටයකු විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල වශයෙන් තම ඒකාබද්ධ වැටුපෙන් 6% ක් ගෙවිය යුතු වේ.

4. වෙනත් අවශ්‍යතාවෝ :

(අ) මුද්‍රිත අයදුම්පත් පෝරම සපයනු නො ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් සකස් කර ගත යුතුය.

(ආ) අයදුම්පත්, 1973 පෙබරවාරි මස 14 වෙනි දින දහවල් 12 ට පෙර, ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින්, කොළඹ 2, ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

අයදුම්පතෙහි සහ අයදුම්පත බහාලන කවරයෙහි වම්පස උඩ කෙළවරේ "අයදුම්පත—ගුවන් භටයෝ" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් පෝරමයෙහි සියලුම කොටු හැකි තරම් විස්තර සහිතවත් ඉතා පැහැදිලිවත් පුරවා තිබිය යුතුය.

(ඇ) අයදුම්පත් කිසිම පුද්ගලයකුගේ නමට නොඑවිය යුතුය. නිවැරදි ලිපිනය මෙසේ ය :

ගුවන් හමුදාපති තුමා,
මූලස්ථානය,
තැ. පෙ. 594,
කොළඹ 2.

(ඈ) අයදුම්කරු රැකියාවක නියුක්තව සිටී නම්, තම වර්තමාන සේවායෝජකගෙන් ලබාගත් නිර්දේශයක් ද අයදුම්පත සමග එවිය යුතුය. අනිකුත් අයදුම්කරුවන් විසින් තමන් අන්තිමට ඉගෙන ගත් පාසලේ ප්‍රධානාචාර්යවරයාගෙන් ද, පසුගිය අවුරුද්ද තුළ තමා ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් ද ලබාගත් චරිත සහතික දෙකක් අයදුම් පත සමග එවිය යුතුය.

(ඉ) අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතිකවල අනුපිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කර ලද සහතිකය බාර ගනු නොලැබේ.)

(ii) ලබා ඇති උසස් ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) ඉහත (ඇ) ඡේදයෙහි සඳහන් චරිත සහතික.

සැ. යු. මේ සහතිකවල හා චරිත සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබූ විට අයදුම්කරු ඉදිරිපත් කළ යුතුය.

(ඊ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

(උ) ගුවන් හමුදා සේවය සඳහා සුදුස්සන් වීමට ඉඩ ඇති අපේක්ෂකයන් තමන්ට නියම කරනු ලබන දිනකදී, වේලාවක දී හා ස්ථානයක දී ගුවන් හමුදාවේ ගුවන් භටයන් බඳවා ගන්නා නිලධාරීන් ඉදිරියේ තමන්ගේ ම වියදමින් පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු විසින් ම අනුමත හැඳින්වීමේ පතක් හෝ හඳුනා ගැනීම සඳහා වෙනත් සතුටුදායක සාධක (එනම්, වගකිවයුතු පුද්ගලයකු විසින් සැබෑ බවට නිසි පරිදි සහතික කරන ලද ඡායාරූප යක්) හෝ ඉදිරිපත් කළයුතු වේ.

(ඌ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් වියහැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු වේ. මේ සඳහා වැය වන ගමන් ගාස්තු ඇතුළු සියලු වියදම් ඔවුන් විසින් දරාගත යුතු වේ.

(එ) යම් අපේක්ෂකයකු තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහි ලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය එයින් ම අවලංගු වීමට හේතු වන්නේ ය. මෙම ව්‍යවස්ථාව තදින් ම ක්‍රියාත්මක කරනු ලැබේ.

(ඒ) ඉහත සඳහන් අවශ්‍යතාවන් සපුරා නොලන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඔ) සම්මුඛ පරීක්ෂණ ආදියෙහි දී අපේක්ෂකයන් අසමත් වූ විට ඒ ගැන ඔවුන්ට දැනුම් දෙනු නොලැබේ.

පී. එච්. මෙන්ඩිස්,
ගුවන් කොමදෝරු,
ගුවන් හමුදාධිපති.

1973 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ. තැ. පෙ. 594, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ
මූලස්ථානයේ දී ය.

අයදුම්පත

1. (අ) නම (පැහැදිලි අකුරෙන්) :————.

අගට යෙදෙන නම :————.

සෙසු නම් :————.

(ආ) රටවැසි භාවය :————.

2. (අ) පියාගේ නම :————.

(ආ) රටවැසි භාවය :————.

(ලියාපදිංචි වීමෙන් රටවැසිකම ලබා ඇත්නෙක් නම් සහතිකයේ දිනය හා අංකය සඳහන් කළ යුතුය)

3. (අ) තැපැල් ලිපිනය :————.

(ආ) ළඟම ඇති විදුලි පණිවුඩ කාර්යාලය :————.

(ඇ) ළඟම ඇති පොලිස් ස්ථානය :————.

4. (අ) උපන් ස්ථානය :————.

(ආ) උපන් දිනය :————.

(ඇ) 1973 ජනවාරි 1 වන දිනට වයස :—අවුරුදු ————. මාස :————. දින :————.

5. (අ) උස :————.

(ආ) පපුව :————.

(ඇ) බර :————.

6. සමත් වී ඇති විභාග (විෂයයන් සහ දිනයන් සහිතව) : ————.

7. පාසැල හෝ විද්‍යාලය හැර යාමෙන් පසුව නියුක්ත වූ රැකියාව :————.

8. තෝරාගත් වෘත්ති ගණ :—(1) ————, (2) ————.

(සැලකිය යුතුයි : වෘත්ති ගණ තෝරා ගැනීම කළයුත්තේ ගැසට් නිවේදනයෙහි 1 වන ඡේදයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලවය.)

9. සිවිල් උසාවියකදී ඔබ වැරදිකරු වී ඇත්නම් හෝ ඔබේ ඇඟ බැඳ තිබේ නම් හෝ සම්පූර්ණ විස්තර සපයන්න :————.

10. ක්‍රීඩා කුසලතා :————.

11. වෙනත් අදාළ කරුණු :————.

12. ඉදිරිපත් කර ඇති චරිත සහතික නිකුත් කළ අයගේ නම් සහ පදවි නාම :————.

13. අයදුම්කරු විසින් අත්සන් තැබියයුතු ප්‍රකාශනය :————.

මෙම අයදුම් පතෙහි මා විසින් සඳහන් කොට ඇති සියලුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, සේවයට බඳවා ගැනීමට පෙර එම වරද හෙළි වී නම්, නුසුදුස්සකු කරනු ලැබීමටත්, බඳවා ගැනීමෙන් පසුව හෙළි වී නම්, ගුවන් හමුදා පනතෙහි නියමිත පරිදි සේවයෙන් පහ කරනු ලැබීමට හෝ වෙනත් දඬුවම් ලැබීමටත් මා යටත් වන බව මම දනිමි.

.....................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :—1973 ......................

1–570—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

ගාලු දිස්ත්‍රික්කයේ බටදූව කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කඩවත් සතර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

බටදූව උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන. ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 මාර්තු මස 2 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය.

4. මේ ධුරය සඳහා ඉල්ලුම් පත්‍ර කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

එස්. සිවනාන්දම්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
ගාල්ල, 1973 ජනවාරි මස 19 වෙනි දින.

1–581/1—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

**ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කඩවත් සතර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

අක්මීමන උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 මාර්තු මස 2 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

4. මේ ධුරය සඳහා ඉල්ලුම් පත්‍ර කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

එස්. සිවනන්දම්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,
ගාල්ල, 1973 ජනවාරි මස 19 වෙනි දින.

1–581/2—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ ඊච්චන්තීවු කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනෙපත්තු උතුර කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

ඊච්චන්තීවු උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි පදිංචි වී සැහෙන දේපලක් ද, ගම්වාසීන්ගේ සැලකිල්ල ද අත්කර ගෙන ඇත්තාවූ හෝ ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් ඉහත සඳහන් ඇබෑර්තුව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපායි.

2. අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ගම්බද උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදියෙහි ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලා ගත හැකිය.

3. සියලුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ලියා, ඒවා ලියාපදිංචි තැපෑලෙන් 1973.02.19 දින හෝ එදිනට පෙර හෝ මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1972 දෙසැම්බර් මස 27 දින ,
මඩකලපුව
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

1–450—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**රත්නපුර දිස්ත්‍රික්කයේ මොරහැල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ කඩවත සහ මැද කෝරළේ කොට්ඨාශයේ විවාහ (උඩරට සහ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය**

මොරහැල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සෙවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික සහ අනිකුත්, සුදුසුකම් ආදිය පිළිබඳව සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන සහ කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘතිපත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1973 පෙබරවාරි 20 දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සී. සී. ඊ. ෆොන්සේකා,
අතිරේක දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1973 ජනවාරි මස 8 වෙනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දීය.

1–710—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය මරදාන**

**ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන සිව් අවුරුදු දිවා/සන්ධ්‍යා ලේඛන ශාස්ත්‍රය පිළිබඳ පාඨමාලාවට ඇතුලත් වීම**

**අධ්‍යයන වර්ෂය 1973**

ඉහත දැක්වෙන පාඨමාලාව සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ:—

**සුදුසුකම් :**

(අ) ලන්ඩන් මැට්‍රික් විභාගය.

(ආ) අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී අනුමත විෂයයන් 6 කින් සමත්වීම, මේවා සින් 5කට සම්මාන සාමාර්ථ තිබෙන අතර ඉංග්‍රීසි, ගණිතය හෝ ස්වභාවික විද්‍යාව පිළිබඳ විෂයයක් ඒවාට ඇතුලත් විය යුතුය. සම්මාන සාමාර්ථ අඩු වශයෙන් 4 ක් වත් එකවර ලැබූ ඒවා විය යුතුය.

සැ. යු. අනුමත විෂයයන් මෙසේය :

(1) ඉංග්‍රීසි සහ
(2) ගණිතය හෝ ස්වභාවික විද්‍යාවක්.
(3) නූතන භාෂාවක්, භූගෝල විද්‍යාව, ඉතිහාසය, වාණිජ විද්‍යා මූලධම්, ගණන් තැබීම, ආර්ථික විද්‍යාව, හෝ (2) හි ඇතුලත් නොවී ඇත්නම් ස්වභාවික විද්‍යාවක්.

(ඇ) වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ප්‍රාථමික විභාගය හෝ,

(ඇ) වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ප්‍රාථමික විභාගයෙන් නිදහස් කර තිබීම.

සන්ධ්‍යා පාඨමාලාවට ඇතුලත් කිරීමේදී සීමා සහිත සමාගමක හෝ රජයේ ආයතනයක හෝ ප්‍රසිද්ධ ආයතනයක හෝ සංගමයක කාර්යාලයක සේවයේ නියුක්තවූවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ හෝ ලේකම්වරුන්ගේ සංස්ථාවේ මධ්‍ය පරීක්ෂණයෙන් සමත් වූවන් හා අවසාන විභාගයේ කාණ්ඩයක් හෝ කොටසකින් සමත්වූවන් පාඨමාලාවේ නියමිත වර්ෂයට කෙලින්ම බඳවා ගනු ලැබේ.

2. සන්ධ්‍යා පාඨමාලාව සඳහා අදාල රක්ෂාවන්හි නියුතුවූවන්ගේ ඉල්ලුම් පත්‍ර සමණක් සැලකිල්ලට භාජනය කරණු ලබන අතර සියළුම ඉල්ලුම් පත්‍ර සේවා යෝජකයා මගින් ඉදිරිපත් කළ යුතුය. සේවා යෝජකයා විසින් ඉල්ලුම් පත්‍ර නිර්දේශ කිරීමේදී අයදුම්කරුවන්ගේ සේවයේ ස්වභාවය පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**3. වයස.—1973.1.1 දිනට අවුරුදු 17 ට නොඅඩු විය යුතුය.**

4. අයදුම්පත් භාරගනු ලබන්නේ ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පමණි.

5. ඉහත සඳහන් පාඨමාලාව සඳහා ප්‍රවේශ විභාගයක් නොපැවැත් වේ. ඇතුළුවීම තීරණය කරනු ලබන්නේ වාචික පරීක්ෂණයක් මගින් පමණි.

6. පහත සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද සියළුම ඉල්ලුම් පත්‍ර කොළඹ 10 ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත 1973 පෙබරවාරි 7 වැනි දින හෝ ඊට පෙර ඔහු වෙත ලැබෙන ලෙස ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

7. අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයට අනුකූලව පුරවා නොමැති හෝ ප්‍රමාදවී ලැබුන හෝ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සන්ධ්‍යා පාඨමාලාවට තෝරාගනු ලැබූ අයවළුන්ගෙන් සෑම අධ්‍යයන වර්ෂයකට නියමිත මාස 9 ට මසකට රු. 15 බැගින් විද්‍යාලීය ගාස්තු අයකරණු ලැබේ.

පී. ඩී. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2, 1973 ජනවාරි 9 දා.

ලංකා කාර්මික විද්‍යාලය—මරදාන, අධ්‍යයන වර්ෂය 1973

**ඇතුල්වීමේ අයදුම් පත**

**වැදගත්.**—මෙම පෝරමය පුරවා, කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ, ලේඛාධිකාරි වෙත ලැබෙන සේ තැපැල් කළ යුතුය.

(1) පාඨමාලාව දිවා/සන්ධ්‍යා

(2) අයදුම්කරුගේ සම්පූර්ණ (පැහැදිලි අකුරින්) :————.

(3) මුලකුරු සමග නම :————.

(4) උපන් දිනය :————.
1.1.1973 දිනට වයස අවු :————, මාස :————.

(5) ජාතිය :————.

(6) ස්ත්‍රී පුරුෂ බව :————.

(7) පෞද්ගලික ලිපිනය :————.

(8) ව්‍යාපාර ලිපිනය :————.

(9) සමත් වූ විභාග, (විෂයයන් හා ලබාගත් ශ්‍රේණිය, අවුරුදු හා මාසයන් සඳහන් කරන්න) :————.

(10) මෙම කොටුව පිරවිය යුතු මීට ඉහත මෙම විද්‍යාලයේ පාඨමාලාවකට සහභාගිවූ අය පමණි :————.

(11) ප්‍රවේශ පත්‍ර අංකය :————.
හැදෑරූ පාඨමාලාව :————.
වර්ෂය :————.
(ලබාගත් සහතික සඳහන් කරන්න).

**සන්ධ්‍යා පංති වලට ඇතුලුවීමට බලාපොරොත්තු වන්නන් විසින් පිරවීම සඳහා**

අයදුම්කරුගේ රැකියාව, සේවා යෝජකයාගේ නම සහ ලිපිනය : ————.

අයදුම්කරු විසින් ඉටුකරනු ලබන කාර්යයේ ස්වභාවය පිළිබඳ සම්පූර්ණ විස්තර සැපයිය යුතුය :————.

(12) මව්පිය/භාරකරුගේ රැකියාව—නම සහ ලිපිනය :————.

මා විසින් ඉහත සපයා ඇති සියලු තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

1–686—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

**මැනුම් දෙපාර්තමේන්තුව**

**මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය—දියතලාව**

**1973 ජූනි මස ආරම්භය වන ශාස්ත්‍රාලයීය වර්ෂය**

දියතලාවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ, මැනීම හා සිතියම් ගත කිරීම පිළිබඳ එක් අවුරුදු නේවාසික පාඨමාලාවක් හැදෑරීම සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට පිරිමි අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් 1973 මාර්තු 15 දින තෙක් දියතලාවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සහකාර සර්වේයර් ජනරාල් විසින් භාර ගනු ලැබේ.

පහත සඳහන් ස්ථාන වලින් ආකෘති පත්‍ර ලබා ගත හැකිය.

කොළඹ 5, කිරුළ පාරේ, සර්වේයර් ජනරාල් කාර්යාලයේ අභ්‍යාස ආයතන අංශය, යාපනය, වවුනියාව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, පුත්තලම, මහනුවර බදුල්ල, මඩකලපුව, පොළොන්නරුව, කුරුණෑගල, රත්නපුරය, ගාල්ල හෝ හම්බන්තොට, ප්‍රාදේශිය මැනුම් කාර්යාල හෝ දියතලාවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සහකාර සර්වේයර් ජනරාල් (පුහුණු).

එම ආකෘති පත්‍රවල, රුපියල් 1 ක් වටිනාකම ඇති මුද්දර අලවා විධිවූ පරිදි අත්සන් කොට ඒවා අවලංගු කළ යුතුය. කුමන අන්දමින් හෝ දෝෂ සහිත වන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ. වැඩි විස්තර අවශ්‍ය නම් දියතලාවේ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ සහකාර සර්වේයර් ජනරාල් (පුහුණු) ගෙන් ලබා ගත හැක.

**දැනටමත් රජයේ සේවයේ හෝ රජයට අයත් සංස්ථාවල හෝ මණ්ඩලවල හෝ සේවය කරන අයදුම්කරුවන් විසින් පහත දෙවන ඡේදයේ** සඳහන් සුදුසුකම් ලබා ඇත්නම්, ඔහු මෙම පාඨමාලාවට තෝරා ගනු ලැබුවහොත්, එක් වර්ෂයක පූර්ණ වේතන සහිත අධ්‍යයන නිවාඩු ලබා ගැනීමට හැකිවන බවට තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ හෝ සංස්ථාවේ හෝ මණ්ඩලයේ සභාපතිගේ සහතිකයක්ද සමග ඔහු මගින්ම තම ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය.

2. **යෝග්‍යතාවය.**—මෙම පාඨමාලාව සඳහා අයදුම්කරුවන්

(අ) පෙළපතින් හෝ ලියා පදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ආ) පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුය.

(i) (අ) ශුද්ධ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් (1970/71 ශාස්ත්‍රාලීය වර්ෂයකට පෙර පහත (ii) (අ) ඡේදයේ සඳහන් සහතිකය ලබාගත් අයදුම්කරුවන් ශුද්ධගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථයක්) හා භෞතික විද්‍යාව සඳහා සාමාර්ථයක් ද සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබා ගත් පහත දැක්වෙන පරිදි අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් 6 ක්, එනම්
(i) ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ සාමාර්ථයක්
(ii) භෞතික විද්‍යාව සඳහා සාමාර්ථයක්
(iii) ශුද්ධ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක්
(iv) වෙනත් විෂයයන් 3 කින් සාමාර්ථයක්.

(ii) (අ) කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික ආයතනයේ හෝ වෙනත් ඕනෑම කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක් හෝ බහුතාක්ෂණික ආයතනයක් හෝ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ මැනුම් අභ්‍යාස විද්‍යාලය විසින් මෙහෙයවන ලද මැනීමේ හා තලමිතිය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන දිවා පාඨමාලාව හෝ තුන් අවුරුදු සන්ධ්‍යා පාඨමාලාව හෝ සම්පූර්ණ කිරීමේ සහතිකය, හෝ
(ආ) ඊට සමාන කාර්මික සුදුසුකම්.

(iii) පහත සඳහන් සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් සඳහාද මෙම ආයතනය විවෘතව ඇත :—
(අ) ගණිත සඳහා උපාධියක්.
(ආ) අ. පො. ස. උසස් පෙළ විභාගයෙන් සාමාර්ථයක් සමග මැනීම පිළිබඳ ඊට සමාන දැනුමක්.
(**නිදසුනක් :** ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවේ I වැනි වර්ෂය හෝ භූගෝල විද්‍යාව පිළිබඳ පාඨමාලාවේ II වැනි වර්ෂය සතුටුදායක ලෙස අවසන් කළ අයදුම්කරුවන්)

3. **යෝග්‍යතාවය පිළිබඳ ලියකියවිලි :** 4 වැනි ඡේදයෙන් යොමු කරන ලද ලිඛිත පරීක්ෂණයකට ප්‍රථමයෙන්, පහත සඳහන් ලියකියවිලි (මුල් පිටපත්) සැපයිය යුතුය.

(අ) 2 (ආ) ii (අ) දරණ ඡේදයෙහි සඳහන් ආයතනවලින් ඕනෑම ආයතනයක විදුහල්පති කෙනෙකු විසින් අත්සන් තබන ලද, සහපත් චරිතය පිළිබඳ සහතිකයක්.

(ආ) අයදුම්කරුගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ සහතික කරන ලද පිටපතක්.

(ඇ) ලංකා පුරවැසියෙකු වශයෙන් ලියා පදිංචි කිරීමේ සහතිකය හෝ පුරවැසිභාවය ලැබීමට ඇති හිමිකම පිළිගත් බව දක්වන මූලික නිල ලිපි (අදාල පරිදි)

(ඈ) 2 (ආ) ඡේදයේ දැක්වෙන සුදුසුකම් පිළිබඳ සහතිකය මූලික සහතික පත්‍රය තවම ලැබී නොමැති නම්, ආයතනයේ ආයතනාධිපතිගෙන් ලත් ලිපියක් භාරගනු ලැබේ.

**4. ඇතුළත් කිරීම.**—අවශ්‍යසුදුසුකම් ඇති අයදුම්කරුවන්, ශුද්ධ ගණිතය (ලකුණු 200), භෞතික විද්‍යාව (ලකුණු 100), සාමාන්‍ය දැනීම (ලකුණු 100), බුද්ධිය (ලකුණු 300), මැනුම් හා තලමිති ශිල්පය (ලකුණු 200) සහ සැලසුම් ශිල්පය (ලකුණු 1.0) ද පිළිබඳව ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට එම පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය සහ වේලාව පසුව දැනුම් දෙනු ලැබේ. ඉන් පසුව, සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට අවසාන තේරීම කරනු ලැබේ.

තදනන්තරව මෙම පාඨමාලාවට ඇතුළත්වීම දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියෙකු විසින් කරනු ලබන නියමිත වෛද්‍ය පරීක්ෂණයකින් අයදුම්කරු සමත්වීම මත රඳා පවතී. මෙම වෛද්‍ය පරීක්ෂණය. රජයේ දෙපාර්තමේන්තුවල රැකියාවන් ලබා ගැනීමේ අයදුම්කරුවන් පෙනී සිටිය යුතු සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණයම විය යුතු නැත. මෙම අයදුම්කරු පුහුණුව ලැබීමට හා ක්ෂේත්‍ර කටයුතුවල යෙදීමට කායික වශයෙන් සතුටුදායක බවට දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරියාගෙන් ලබා ගත් සහතිකයක් ප්‍රමාණවත් ය. පාඨමාලාව පටන් ගැනීමට ප්‍රථමයෙන් මෙය කළ යුතුය

වැඩ කටයුතු කිරීමෙහි ලා ප්‍රමාණවත් උද්යෝගයක් හෝ උපදෙස් අනුගමනය කිරීමට හැකියාවක් හෝ නොදක්වන ශිෂ්‍යයන් නිසි පරිදි අවවාද කිරීමෙන් පසු ඉවත් කිරීමටද ඉඩ ඇත. ඇතුළත් කිරීම හෝ ඉවත් කිරීම පිළිබඳව සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

**5. ඉගැන්වීමේ මාධ්‍යය :**—සිංහල සහ දෙමළ වේ.

**6. ඉඩ පහසුකම්.**—අවිවාහකයින් සඳහා වූ ඉඩපහසුකම් (අවශ්‍ය ගෘහභාණ්ඩ දෙක තුනක් ද ඇතුළුව) හා පොදු මුළුතැන් ගෙයක් ද ශිෂ්‍යයනට නොමිලේ සපයනු ලැබේ.

**7. ගාස්තු හා තැන්පත්.**—ඉගැන්වීමේ හෝ පුස්තකාල ගාස්තු හෝ අය කරනු නොලැබේ. ඇතුළත් වූවන් විසින් කැඩුම් බිඳුම් ආදිය සඳහා ආපසු ගෙවන ලබන රු. 30 ක තැන්පත් මුදලක් සැපයීම අවශ්‍ය වන්නේ ය.

**8. ඩිප්ලෝමා.**—උසස් කාර්මික මට්ටමක් දක්වා පාඨමාලා මෙහෙයවනු ලැබේ. සමත්වනු ලබන අයදුම්කරුවන්ට මැනීම පිළිබඳව ඩිප්ලෝමා සහතිකයක් පිරිනමනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් රැකියාවක් සැපයීම පිළිබඳ සහතික කිරීමක් මෙම ඩිප්ලෝමා සහතිකයෙන් ප්‍රකාශ කිරීමක් හෝ ඇඟවීමක් සිදු නොකෙරේ.

කෙසේ වුවත්, මැනුම් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු ඇති විටදී හෝ ඇතිවන විටදී එම පුරප්පාඩු පුරවනු ලබන්නේ රාජ්‍ය උපදේශක මණ්ඩලයේ එකඟත්වයට අනුව ආධුනික කාලය අවසානයේදී වයස අවුරුදු 30 ට අඩුවූ ආයතනයේ ඩිප්ලෝමා සහතික දරන්නවුන් අතරිනි.

මැනුම් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරනු නොලැබූවන් හට ආධුනික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් සහ මැනීම, තලමිතිය සහ පිඹුරු ඇඳීම පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීමෙන් පසුව, මිනින්දෝරුවකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා බලපත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

ආර්. ඒ. ගුණවර්ධන,
වැ. බ. සර්වේයර් ජනරාල්.

සර්වේයර් ජනරාල් කාර්යාලය,
(අභ්‍යාස ආයතන අංශය)
තැ. පෙ. 506—කොළඹ 5.
1973 ජනවාරි මස 09 වැනි දින,

1–707—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

---

අධ්‍යාපන අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය, මරදාන

වාණිජ අංශයේ පාඨමාලාවලට ඇතුළත් වීම—1973 අධ්‍යයන වර්ෂය

මරදාන ලංකා කාර්මික විද්‍යාලයේ වාණිජ අංශයේ පහත සඳහන් පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

| පාඨමාලාව | මාධ්‍යය | කාල පරිච්ඡේදය | කාලය |
|---|---|---|---|
| වාණිජ ඩිප්ලෝමා ... | ඉංග්‍රීසි ... | අවුරුදු 4 යි ... | පූර්ණ දිවාකාල |

2. මෙම පාඨමාලාවට ඇතුළත් කර ගැනීම තීරණය කරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණි.

3. අධ්‍යාපන යෝග්‍යතා.—

(1) පොත් තබන්නන්ගේ උසස් වාණිජ සහතික පත්‍රය (ඉංග්‍රීසි මාධ්‍ය) හෝ එයට සමාන විභාගයක් හෝ,

(2) අ.පො.ස. (සාමාන්‍ය) විභාගයේදී ඉංග්‍රීසි විෂයයෙන් සාමාර්ථයක් සහිතව අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් හතරකින් සමත්වීම. අ.පො.ස. උසස් පෙළ විභාගයේදී (ආර්ථික විද්‍යාව වාණිජ විද්‍යාව හා මුදල්, ගණකාධිකරණය සහ ආණ්ඩුක්‍රම යන විෂයයන් සමත් අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) හෝ,

(3) මහරගම වාණිජ ගුරු පුහුණු සහතිකය හෝ,

(4) විභාග කොමසාරිස් විසින් පවත්වන ලද වාණිජ සහතික පත්‍ර විභාගය (ගණකාධිකරණ සහතිකය.)

සෙසු යෝග්‍යතා :

(1) මනා චරිතයකින් යුක්තවීම.

(2) ලාංකික පුරවැසියෙකු වීම.

(3) 1973.1.1 දිනට වයස අවුරුදු 17 ට නොඅඩු විය යුතුය.

4. පහත සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද සියළුම ඉල්ලුම් පත්‍ර 1973 පෙබරවාරි 7 වැනි දින හෝ ඊට පෙර කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5. අසම්පූර්ණ හෝ නියමිත ආකෘති පත්‍රයට අනුකූලව පුරවා නොමැති හෝ ප්‍රමාද වී ලැබුන හෝ සියළුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වී. ඔ. පී. ප්‍රනාන්දු,
අධ්‍යාපන අධ්‍යක්ෂ (කාර්මික),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

අධ්‍යාපන අමාත්‍යාංශය
මැලේ වීදිය, කොළඹ 2,
1973 ජනවාරි 9 දින.

ලංකා කාර්මික විද්‍යාලය, මරදාන—අධ්‍යයන වර්ෂය 1973

ඇතුල්වීමේ අයදුම්පත

වැදගත් : මෙම ෆෝර්මය පුරවා කොළඹ 10, ලංකා කාර්මික විද්‍යාලයේ ලේඛාධිකාරි වෙත කෙලින්ම ලැබෙන සේ තැපැල් කළ යුතුය.

1. පාඨමාලාව :————.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
3. මුලකුරු සමඟ නම :————.
4. උපන් දිනය :————. 1973.1.1 දිනට වයස අවු. :————.
   මාස :————.
5. ජාතිය :————.
6. ස්ත්‍රී පුරුෂ බව :————.
7. ලිපිනය :————.
8. සමත් වූ විභාග (විෂයයන් හා ලබාගත් ශ්‍රේණිය, අවුරුද්ද හා මාසයන් සඳහන් කරන්න).
9. මීට ඉහත මෙම විද්‍යාලයේ පාඨමාලාවක් හැදෑරූ අය විසින් පමණක් මේ කොටුව පිරවිය යුතුය.—
   ප්‍රවේශ පත්‍ර අංකය :————.
   හැදෑරූ පාඨමාලාව :————.
   වර්ෂය :————.
10. පියා/මව/භාරකරුගේ රැකියාව නම සහ ලිපිනය :————.

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

1–684—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්න යෙන් දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ ප්‍රකාර ස්වකීය නම් වෙනස් කළ දැනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂක යන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම් වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නොවේ.

(ඈ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියා පදිංචිවීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දැක්වෙන සහතිකයක් (උචිත වන පරිදි) ;

(ඇ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිල්ලක් (උදා.—පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයා ගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්) ;

(ඉ) හේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 5අ සහ 5ආ ඡේදයන්හි දැක්වුණු අපේක්ෂක යන් කෙරෙහි ය.)

(ඊ) ආණ්ඩුවේ සේවය පිළිබඳව ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ 5ඈ වැනි ඡේදයෙහි දැක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(උ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ සඳහා ද මෙය රැගෙන ආ යුතු ය.)

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියලුම ලියකියවිලි සූදානම් ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඒ අවස්ථාවේ දී වුවමනා සියළුම ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**11. අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරන්නට පිළිවන.

අපේක්ෂකයකු අපේක්ෂිකාවක විසින් ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් ඔහු/ඇය දැනුවත් ව ම අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් හෝ එසේ නැතහොත් ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමට නුසුදුසුව සිටි බව ඔහු/ඇය සේවය කරන කාලයේ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් අප්‍රමාදව සේවයෙන් පහ කිරීමට පිළිවන.

**නිවේදනයේ සඳහන් නියමයන් සම්පූර්ණයෙන් පිළි නො පදින අයවලුන් ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.**

**12. මුදල් ආපසු ගෙවීම්.**—කවර කාරණයක් නිසාවත් මුදල් ආපසු ගෙවනු නොලැබේ. මේ විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කරන්නට නො පිළිවන.

**13. විභාගයට පෙනී සිටීම සඳහා ආණ්ඩුවේ නිලධාරීන්ට නිවාඩු දීම.**—විභාග කොමසාරිස් විසින් පිළිගන්නා ලද ඉල්ලුම් පත්‍ර ඇති නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ගේ දෙපාර්ත මේන්තු ප්‍රධානීන් විසින් නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ) දිය යුතු වේ.

**14. විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්තය. 1 වන කොටස ලිඛිත පරීක්ෂණයක් ද, 2 වන කොටස වාචික පරීක්ෂණයක් ද වේ.

විභාග විෂයයන් හා එක් එක් විෂයයකට නියමිත ලකුණු ද පහත සඳහන් වේ. ලිඛිත පරීක්ෂණයේ හැම උත්තර පත්‍රයකින් ම නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝස වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නො පැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

1 වන කොටස (ලිඛිත)

| | | ලකුණු |
|---|---|---|
| (1) | අංක ගණිතය (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) අංක ගණිතය ද, එකතු කිරීම හා වෙනත් නොයෙක් විශී වල එකතු කිරීම්ද, ඇතුළුව, ඉලක්කම් සම්බන්ධ නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා වූ පැ. 1½ ක පත්‍රයකි. ... ... | 100 |
| (2) | සාමාන්‍ය දැනීම (සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි) විනාඩි 30 ක පත්‍රයකි. ... ... | 50 |

මෙම විභාගය සඳහා වූ කාල සටහන පහත දැක්වේ—

පූර්ව භාග 9.00 සිට පූර්ව භාග 10.30 දක්වා—අංක ගණිතය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

පූර්වභාග 10.45 සිට පූර්වභාග 11.15 දක්වා—සාමාන්‍ය දැනීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

විභාග කොමසාරිස් විසින් කාල සටහනේ පිටපත් නිකුත් නො කරන බැවින් අපේක්ෂකයන්ගේ ප්‍රයෝජනය සඳහා මෙම කාල සටහන සටහන් කර ගන්නා ලෙස අපේක්ෂකයන්ට දන්වා සිටිනු ලැබේ.

2 වන කොටස (වාචික පරීක්ෂණය) ... 50

වාචික පරීක්ෂණය පවත්වනු ලබන්නේ අපේක්ෂකයා සම්පූර්ණ විභාගයට ඉදිරිපත් වන භාෂාවෙන් ම ය.

පළමුව පවත්වනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයයි. දෙවැනිව ඉන් ලකුණු ලබාගත් අන්දම අනුව තෝරා ගනු ලබන අපේක්ෂකයන් සඳහා වාචික පරීක්ෂණයක් කොළඹ දී පවත්වනු ලැබේ. එය පැවැත්වෙන දිනය ඒ ඒ අපේක්ෂකයන් වෙත දන්වා එවනු ඇත. පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අපේක්ෂක සංඛ්‍යාව රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාග කොමසාරිස් සමඟ ද සාකච්ඡා කිරීමෙන් පසුව තීරණය කරනු ඇත. කෙසේ වුවද, ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් ලබන අපේක්ෂක සංඛ්‍යාව පිරවිය යුතුව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් වාචික පරීක්ෂණය අත්හැර දැමීමට ඉඩ තිබේ.

**15. ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම හා පත්වීම් දීම.**—සාමාර්ථය ලබන අපේක්ෂකයන්ගේ නම් ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ඇත. පුරප්පාඩුව ඇති වන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

**16. ඇබෑර්තු.**—සේවයේ අවශ්‍යතාවයන් ගැන සලකා බලා, මේ විභාගයේ ප්‍රතිඵල අනුව පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

**17. වෛද්‍ය පරීක්ෂණය.**—සාමාර්ථය ලබන අපේක්ෂකයෝ දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍ය යෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සමත් විය යුත්තාහ.

18. මෙම රෙගුලාසි වලින් විස්තර නො කරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

බී. මහාදේව
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ වැඩ බලන රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජනවාරි මස 09 වැනි දින,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේදීය.
කොළඹ 7,

**අයදුම් පත්‍රය**

ලංකා විභාග දෙපාර්තමේන්තුව

| විභාග අංකය : (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.) |
|---|

**සරප් සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1973 මාර්තු**

(1) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.

| ස්ත්‍රී පුරුෂ භාවය |
|---|

(2) මුලකුරුවලින් හැඳින්වෙන නම :————.

3. සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයින් කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි) :————.

4. ඔබ විභාගයට පෙනී සිටීමට කැමති ස්ථානය :—
(පළමු තේරීම) :————.
(දෙවන තේරීම) :————.

5. (අ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—
(i) පරම්පරාවෙන් ද, නැතහොත් :————.
(ii) ලියාපදිංචි කිරීමෙන් ද, යන බව සඳහන් කරන්න :————.

(ආ) උපන් ස්ථානය :—
(i) අපේක්ෂකයාගේ :————.
(ii) අපේක්ෂකයාගේ පියාගේ :————.
(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ : ————.
(iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

**සංලක්ෂ්‍ය :** අපේක්ෂකයා සහ ඔහුගේ/ඇගේ පියා ද යන දෙදෙනා උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා හෝ/ ඔහුගේ/ඇගේ පියා හෝ උපන්නේ ලංකාවෙන් පිටතදී නම් (i), (ii), (iii), (iv) යන සියල්ලම පිරවිය යුතුයි.

6. සුදුසුකම් :
(අ) විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබා ඇත්තේ ඒ පිළිබඳ ගැසට් නිවේදනයේ කුමන ඡේදය/උප ඡේදය යටතේ ද යන බව පැහැදිලිව සඳහන් කරන්න :————.
(ආ) උපන් දිනය :————.
(ඇ) අධ්‍යාපනික සුදුසුකම් :————.

7. (i) ඉහතින් මා දී ඇති තොරතුරු මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙයට අලවා ඇත්තේ කලින් පාවිච්චි නො කරන ලද්දා වූ වලංගු මුද්දර බවත්, මෙයින් දිවුරා සහතික කරමි.
(ii) මේ විභාගය හා සම්බන්ධ නීති රීතිවලට යටත් වීමට මම එකඟ වෙමි.

8. මුද්දර කොටුව :

**සැළකිය යුතුයි.**—විභාගාපේක්ෂකයා රුපියල් හතලිහක් වටිනා මුද්දර මෙම කොටුවෙහි අලවා ඒ උඩ අත්සන් සහ දිනය යොදා අවලංගු කළ යුතුයි. මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.

| |
|---|
| මුද්දර කොටුව |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

* ........................ සේවයේ නියුක්ත/පදිංචි ........................ නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1973 ........................ මස ...... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන :————,
නම, පදවිය හා තරාතිරම :————,

ලිපිනය :————.

* (දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසිනි.)

අනිකුත් අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සමාදාන විනිශ්චය කාරයකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, පෙරකදෝරුවකු, මහජන නොතාරිස් කෙනකු, රජයේ හෝ අධ්‍යක්ෂ පාලිත පාසලක ප්‍රධානයකු, නාවුක, ගගන, යුද්ධ හමුදාවක කොමිෂන් නිලධාරියකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් බාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කෙනෙකු විසිනි.

## ශ්‍රී ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

### විභාගාපේක්ෂකයින් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුයි. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස් අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍ර යම් කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වශයෙන්ම යුත්තන්ට සැළකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියා සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසල දීත් විභාගශාලාපතීන්ටද ඔහුගේ සහකාරයන්ටද අනික් විභාගාපේක්ෂකයන්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළු වන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුයි.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිට වී යාමද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කථාබස් කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම ආදියක් අවශ්‍ය වුහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබාගත යුතුයි.

6. විභගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමටද සිදු වෙනවා ඇත.

දීග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරි පත් නො වූවකුසේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකය කුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
වැ. බ. විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

1–751—73.01.19 දින අංක 43 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම් සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 73. 1. 5 | සිකුරාද | ... | 72.12.27 | බදාදා | දවල් | 12.00 |
| | 73. 1.12 | සිකුරාද | ... | 73. 1. 3 | බදාදා | දවල් | 12.00 |
| | 73. 1.19 | සිකුරාද | ... | 73. 1.10 | බදාදා | දවල් | 12.00 |
| | 73. 1.26 | සිකුරාද | ... | 73. 1.17 | බදාදා | දවල් | 12.00 |
| පෙබරවාරි | 73. 2. 2 | සිකුරාද | ... | 73. 1.24 | බදාදා | දවල් | 12.00 |
| | 73. 2. 9 | සිකුරාද | ... | 73. 1.31 | බදාදා | දවල් | 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්දා | ... | 73. 2. 7 | බදාදා | දවල් | 12.00 |
| | 73. 2.23 | සිකුරාද | ... | 73. 2.14 | බදාදා | දවල් | 12.00 |
| මාර්තු | 73. 3. 2 | සිකුරාද | ... | 73. 2.21 | බදාදා | දවල් | 12.00 |
| | 73. 3. 9 | සිකුරාද | ... | 73. 2.28 | බදාදා | දවල් | 12.00 |
| | 73. 3.16 | සිකුරාද | ... | 73. 3. 7 | බදාදා | දවල් | 12.00 |
| | 73. 3.23 | සිකුරාද | ... | 73. 3.14 | බදාදා | දවල් | 12.00 |
| | 73. 3.30 | සිකුරාද | ... | 73. 3.21 | බදාදා | දවල් | 12.00 |
| අප්‍රේල් | 73. 4.4. | සිකුරාද | ... | 73. 3.28 | බදාදා | දවල් | 12.00 |
| | 73. 4.11 | බදාදා | ... | 73. 4. 4 | බදාදා | දවල් | 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්දා | ... | 73. 4.11 | බදාදා | දවල් | 12.00 |
| | 73. 4.27 | සිකුරාද | ... | 73. 4.18 | බදාදා | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.